**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2015**

---

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජංගම නොවන වත්කම් සඳහා වූ ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.27,833,407 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේපල, පිරියත හා උපකරණ අයිතම සාධාරණ වටිනාකම් සැලකිය යුතු තරම් වෙනස්වීම් වලින් යුක්ත වන්නේ නම් වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය වුවත් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.2,117,041,000 ක් ලෙස දක්වා ඇති විශ්වවිද්‍යාලයේ ඉඩම් 2010 වර්ෂයෙන් පසුව තක්සේරු කර සාධාරණ වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

#### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු

විශ්වවිද්‍යාලයේ තොරතුරු හා තාක්ෂණ අංශයේ කථිකාචාර්යවරියක් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටු වන ලද Lanka Education And Research Network (LEARN) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරන අතර විශ්වවිද්‍යාලය විසින් එම සමාගමෙන් අන්තර්ජාල පහසුකම් ලබා ගෙන තිබුණි. මෙම සම්බන්ධිත පාර්ශවය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙහිවල හා රාජගිරිය ඉදිකර තිබූ නේවාසිකාගාර 02 ක් 2014 වර්ෂයේ සිටද විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිටද ඉදිකිරීම් නිම කර භාවිතයට ගෙන තිබුනද එයට අදාළ එකතුව රු.443,683,413 ක් වූ පිරිවැය ප්‍රාග්ධනීත නොකර කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. තවද මෙම ගොඩනැගිලි වලට අදාළ ක්ෂයවීම් ද ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.63,269 ක් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේපල කුලී වශයෙන් විශ්වවිද්‍යාලයට ලැබෙන ආදායම් විවිධ අරමුදල් වලට බැර කිරීම හා අරමුදල් මගින් දරන වියදම් එම අරමුදලට හර කිරීම තුළින් එම ආදායම් වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් නොවන බව නිරීක්ෂණය විය.

### 2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2014 සැප්තැම්බර් මාසයේ විශ්‍රාම ලැබූ හිටපු උපකුලපතිවරයාගේ පෞද්ගලික නිවසේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේ අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස සඳහා රු.169,521 ක මුදලක් විශ්වවිද්‍යාල අරමුදලින් පෞද්ගලික ආරක්ෂක සේවා ආයතනයක් වෙත සමාලෝචිත වර්ෂයේදී පාලක සභා අනුමැතිය මත ගෙවා තිබුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.485,666 ක ගෙවිය යුතු ශේෂයෙන් රු.259,400 ක් වසරකට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නේවාසිකාගාර සිසුන් 125 දෙනෙකුගෙන් අය කර ගත යුතු එකතුව රු.87,750 ක නේවාසිකාගාර ගාස්තු අය කර නොතිබුණි.

(ඇ) පොදු කාර්යය වියදම් හා ලිපිද්‍රව්‍ය වෙනුවෙන් අඛණ්ඩ හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රයෙන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ලැබිය යුතු රු.422,961 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371(2)(ආ) | 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබූ මාස 03 සිට මාස 06 දක්වා කාලපරිච්ඡේදයකට අයත් එකතුව රු.922,490 ක් වූ විවිධ අත්තිකාරම් 2016 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.203,688,003 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව මුදල් කමිටු නිර්දේශය හා පාලක සභා අනුමැතිය මත සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තනතුරු දරන නිළධාරීන් තුන්දෙනෙකු සඳහා කාර්යාලයේ සිට නිවස දක්වා ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් රු.30,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබූ අතර 2015 ජනවාරි 01 සිට 2015 අගෝස්තු 31 දක්වා ගෙවා තිබූ මුදල රු.1,060,058 ක් විය. |
| (ඈ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | යොමු ගත චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි පදනම් කරගෙන මාණ්ඩලික නිළධාරීන්ගේ මූලික වැටුපෙන් සියයට 08 සිට සියයට 20 දක්වා එකතුව රු.1,209,675 ක් සමාලෝචිත වර්ෂයේදී සංග්‍රහ වියදම් දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඉ) | 2005 අප්‍රේල් 26 දිනැති අංක 861 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | (i) බාහිර විභාග සම්බන්ධයෙන් වූ සම්බන්ධීකරණ කටයුතු සඳහා ගෙවීම් කිරීමේදී එම සම්බන්ධීකාරක නිලධාරියාගේ මූලික වැටුපෙන් සියයට 25 ක ප්‍රමාණයක් ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලට අමතරව කරන කාර්යයන් සඳහා මාසිකව ගෙවිය යුතු බවට දන්වා ඇතත් එම චක්‍රලේඛයෙන් බැහැරව සම්බන්ධීකාරක වරයෙකුට දිනකට රු.4,000 බැගින් දීමනා ද ගමන් වියදම් දීමනාව ලෙස අධීක්ෂණය කරන එක් දිනකට රු.1,500 බැගින්ද, දුරකථන දීමනාව ලෙස මාසයකට රු.3,000 බැගින්ද ගෙවා තිබුණි. ඒ අනුව ආචාර්යවරුන් තිදෙනෙකුට එකතුව රු.292,485 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>(ii) විභාගය අවසන් වී මාස 03 ක් ඇතුළත ප්‍රශ්න පත්‍ර ලකුණු කර එවීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම වෙනුවෙන් බාහිර විභාග අංශය විසින් පීඨාධිපතිවරයෙකුට වාර්ෂිකව රු.7,500 ක් ද දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට වාර්ෂිකව රු.5,000ක් ද දීමනා වශයෙන් ගෙවිය හැකි වුවත් එම දීමනා පාලක සභා අනුමැතිය මත මාසිකව ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.64,131,233 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,414,730 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.70,545,963 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදම් රු.120,903,698

කින් වැඩි වී තිබුණද පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.193,650,556 කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 හා 2012 වර්ෂ වල අතිරික්තයක් ඇති වී තිබුණි. එසේ වුවද 2013 හා 2014 වර්ෂයන්හිදී එය ඌනතාවයක් බවට පත්වී තිබු අතර නැවතත් 2015 වර්ෂයේදී අතිරික්තයක් බවට පත් වී තිබුණි. කෙසේ වෙතත් සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය අඛණ්ඩව ඉහළ ගොස් තිබුණු අතර 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී දායකත්වය රු.193,122,213 කින් ඉහළ යාම කෙරෙහි පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.193,650,556 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 අධ්‍යයන කාර්යසාධනය

------------------------------

ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සහ අනුමත කරන ලද යම් අධ්‍යයන ක්ෂේත්‍රයක ඉගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම , විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම, පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම, ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් ක්‍රියාකිරීම, උපාධි, අභිඥාණ පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රධානය කිරීම සහ බාහිර විභාග පැවැත්වීම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණු වන අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයීය පීඨ තුනෙහි ශිෂ්‍ය ලියාපදිංචිය හා අවසන් විභාග සමත්වීම පිළිබඳව අධ්‍යයන වර්ෂ 03 කට අදාළව පරීක්ෂා කිරීමේදී විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විභාග සමත්වීමේ ප්‍රතිශතය සියයට 90 ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) <u>පර්යේෂණ දීමනා</u>

(i) පර්යේෂණ දීමනා සඳහා ප්‍රතිපාදිත රු.21,885,000 ක් වූ මුදලින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 110 ක් සඳහා රු.21,469,953 ක් දීමනා ලෙස ලබාදී තිබුණි. මෙම පර්යේෂණ දීමනා ලබා ගත් ආචාර්යවරුන් අතරින් ආචාර්යවරුන් 06 දෙනෙකු තම පර්යේෂණයන්ට අදාල ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයේ පර්යේෂණ පරිසංවාදය 2015 නොවැම්බර් 26 හා 27 දිනයන්හි පවත්වා තිබූ අතර ඒ සඳහා රු.182,579 ක වියදම් දරා තිබුණි. 2014 සහ 2015 වර්ෂයන්වල පර්යේෂණ දීමනා ලබා ගත් ආචාර්යවරුන් හා නිළධාරීන් 110 ක් සිටියද පර්යේෂණ පරිසංවාදය සඳහා පර්යේෂණ පත්‍රිකා 26 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි. පර්යේෂණ ප්‍රගති වාර්තා සහ අවසන් ප්‍රතිඵල ලබා ගැනීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා පර්යේෂණ කළමනාකරණ කමිටුව ඉදිරියේදී කටයුතු කරන බව විගණනයට දන්වා තිබුණි.

(ඇ) මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පශ්චාත් හා දර්ශනපති උපාධි සඳහා රු.10,000,000 ක් හා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙන් පර්යේෂණ කටයුතු සඳහා රු.2,250,000 ක් විශ්වවිද්‍යාලයට ලැබී තිබු නමුත් ඒ සඳහා වැය කළ මුදල පිළිවෙලින් රු.1,770,468 ක් හා රු.500,000 ක් විය. ඒ අනුව අරමුදල් උපයෝජන ප්‍රතිශතය පිළිවෙලින් සියයට 18 ක් හා 22 ක් විය.

(ඈ) විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමට අදාළ නිර්ණායකයන්වලට අනුව පර්යේෂණ නිර්ණායකයන් වැදගත් වන අතර ඒ අනුව පර්යේෂණ සඳහා යොමුවීම හා කැපවීම පහළ

මට්ටමක පැවතීම නිසා 2016 මැයි මාසය වන විට ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 14,402 වන ස්ථානයේ පසු වන බව නිරීක්ෂණය විය.

### 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දින දක්වාම විශ්වවිද්‍යාලයේ ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු නිමකර නොතිබුණි.

(ආ) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පැවති ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී තනතුර සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සප්ත වාර්ෂික නිවාඩු ලබා තිබූ ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරීවරයෙකු සමාලෝචිත වර්ෂයේදී තාවකාලික පදනම මත පත් කර තිබුණි. ඒ අනුව 2015 ජුනි 01 දින සිට 2015 ඔක්තෝබර් 30 දක්වා මාස 04 ක කාලපරිච්ඡේදයක් සඳහා ජීවන වියදම් දීමනා, අන්තර් දීමනා, සියයට 15 විශේෂ දීමනා, සියයට 20 දීමනාවන් ඇතුළුව රු.71,792 ක මාසික දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව සප්ත වාර්ෂික නිවාඩු කාලපරිච්ඡේදයේ කොළඹ විශ්වවිද්‍යාලයෙන් සියළු දීමනා සහිත වැටුප් ලබා ගෙන තිබූ බැවින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන්ද විමසා බැලීමකින් තොරව එම කාලය සඳහා ආසන්න වශයෙන් රු.152,188 ක් වූ මෙම සියළු දීමනා ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපතිවරයෙකු වෙනුවෙන් සේවක භාරකාර අරමුදලට වැඩිපුර ප්‍රේෂණය කර තිබූ රු.31,708 ක මුදලක් ඔහුගේ සේවක පාරිතෝෂික මුදලින් අයකර ගැනීමට එකඟත්වය පල කර තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගෙන නොතිබුණි.

### 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

විශ්වවිද්‍යාලය මඟින් ඉකුත් වර්ෂයේ මුද්‍රණය කර තිබූ “සෞන්දර්ය වංශ කතාව” නැමැති ග්‍රන්ථයේ පිටපත් 420 ක් හා සෞන්දර්ය කලා විමර්ශන කෘති පිටපත් 365 ක් ඉතිරි වී තිබුණි. සෞන්දර්ය වංශ කතාව විකුණුම් මිල අධිකවීම හා කලා විමර්ශන කෘති අලෙවි කිරීමේ ක්‍රමවේදයක් සකස් නොකිරීම හා අලෙවි පුරෝකථනයකින් තොරව මුද්‍රණය කිරීම මෙසේ තොග ඉතිරිවීමට හේතු වී තිබුණි.

### 4.4 කොන්ත්‍රාත් පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නේවාසිකාගාර 60 ක් ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ දෙහිවල ඉදිකරනු ලබන නේවාසිකාගාරයේ පැති බැම්ම ඉදිකිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කොන්ත්‍රාත්කරු විසින් සැලසුම් හා ඇස්තමේන්තු රු.8,761,695 කට සකස් කර තිබුණි. ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව පැති බැම්ම ඉදිකිරීමේ කටයුතු කොන්ත්‍රාත් ආයතනයටම පැවරීමට තාක්ෂණ ඇගයීම් කමිටුව තීරණය කර තිබුණි.

(ආ) 2015 පෙබරවාරි 10 දින ආයතනය වෙත භාරදී තිබූ දෙහිවල කීර්ති හේරත් නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ සිවිලිමේ කොටස් ගැලවී තිබීම, සිමෙන්ති පුපුරා තිබීම, නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඇති ඇතැම් නාන කාමර වල බිම් මට්ටම් නිසියාකාරව සකස් කර නොතිබීම හේතුවෙන් එම ස්ථානවල ජලය එකතු වීම හා විදුලි පංකා වැනි සවිකිරීම් අක්‍රිය වී තිබීම වැනි අඩුපාඩු විගණිත දිනය වූ 2016 ජනවාරි 15 වෙනි දින නිරීක්ෂණය වූ අතර කොන්ත්‍රාත් ආයතනය වෙතින් සකස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන විධායක කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 08 ක් සහ අතිරික්තතා 02 ක් විය. ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සඳහා පුරප්පාඩු 08 ක් හා සුළු සේවක පුරප්පාඩු 18 ක් වූයෙන් මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු සංඛ්‍යාව 34 ක් විය. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 18 ක් පැවති අතර අධ්‍යයන සහයක කාර්යය මණ්ඩලයේ අතිරික්තතා 37 ක් පැවතිණි.

මෙම පුරප්පාඩු හේතුවෙන් විශ්වවිද්‍යාලයේ කටයුතු වලට ඇති වූ බලපෑම නිසා විධායක කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා වැඩ ආවරණය කිරීමේ පදනම මතද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු වෙනුවෙන් අධ්‍යයන සහයක කාර්යය මණ්ඩලයේ අතිරික්ත කාර්යය මණ්ඩලය මගින් ද කාර්යයන් ඉටු කර ගෙන තිබුණි.

(ආ) 1997 නොවැම්බර් 21 දිනැති අංක 721 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය සහ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21.1.1 වගන්තිය අනුව යම් ආචාර්යවරයෙක් අදාල පරිවාස කාලය තුලදී පශ්චාත් උපාධි ලබා ගැනීමට අසමත් වුවහොත් පාලක බල මණ්ඩලය විසින් ඔහුගේ සේවය අවසන් කළ යුතු වුවද එයට පටහැනිව නැවත ඔවුන් තාවකාලික කථිකාචාර්ය ධූරයට පත් කිරීමට කටයුතු කර තිබුණි. සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී තාවකාලික කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සුදුසුකම් සපුරා ගත් දිනයේ සිටම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) තනතුරට උසස් කර තිබුණි.

(ඇ) 1997 නොවැම්බර් 21 දිනැති අංක 721 දරන චක්‍රලේඛයේ 03 වන කාණ්ඩය (ආ) ප්‍රකාරව ආධුනික කථිකාචාර්ය තනතුර සඳහා අදාල විෂයයන්ගෙන් පර්යේෂණයක් සහිත වසර දෙකක පශ්චාත් උපාධියක් අයදුම් කරන දිනට පැවතිය යුතු වුවත්, අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට එම සුදුසුකම සම්පූර්ණ කර නොතිබුණු අයෙකුගේ පත්වීම 2011 නොවැම්බර් 11 දින පැවති 83 වන පාලක සභාව විසින් අනුමත කර තිබුණි.

**4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිටපු උපකුලපති කාර්යාලයට අයත් සාකච්ඡා කාමරය හා එහි කාර්යාල උපකරණ 2014 පෙබරවාරි සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රයෝජනවත් කාර්යයක නොයොදවා නිශ්ක්‍රියව පැවතුණි.

(ආ) රෙදිපිළි ඇඟලුම් අධ්‍යයන අංශය සඳහා මිලට ගත් රු.565,000 ක් වටිනා Universal Hydraulic යන්ත්‍රය 2013 ඔක්තෝබර් 18 දින විශ්වවිද්‍යාලයට ලැබී තිබූ අතර වසර 2 කට අධික කාලයක් ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව තිබූ බව නිරීක්ෂණය විය.

**4.7 හඳුනාගත් පාඩු**

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බද්දු පදනම මත ලබා ගත් නේවාසිකාගාර වලට සිදු වූ අලාභ හානි වෙනුවෙන් නේවාසිකාගාර අයිතිකරුවන් වෙත රු.3,642,432 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් සේවක භාරකාර අරමුදල් මණ්ඩලය වෙත අර්ධ වාර්ෂික වාර්තා ප්‍රමාද වී ඉදිරිපත් කර තිබීම හේතුවෙන් එම අරමුදල විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව පවරා තිබූ නඩු දෙකක් සමතයකට පත් කර ගැනීම සඳහා දඩ මුදල් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.169,847 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව 2014 - 2018 වර්ෂවලට අදාළව සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. එහෙත් මෙම සැලැස්ම පිළියෙල කිරීම සඳහා 2014 මැයි 15 දින පෞද්ගලික උපදේශක සමාගමක් වෙත පවරා තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව මෙම කාර්යය 2014 ජුලි 15 දින නිම කළ යුතු වුවද කාර්යය නිම කර තිබුණේ 2015 දෙසැම්බර් මාසයේදීය. සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට වර්ෂ 1 ½ ක පමණ කාලයක් ගත කර තිබුණු අතර විශ්වවිද්‍යාලය විසින් රු.943,500 ක් උපදේශක සමාගම වෙත ගෙවා තිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 50 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

2008 සහ 2012 වර්ෂ වලදී ගිවිසුම් කඩකරන ලද ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,617,048 ක මුදල සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. පසුගිය විගණන වාර්තා වලින්ද මේ පිළිබඳව පෙන්වා දුන් නමුත් වර්ෂ 3 සිට වර්ෂ 8 දක්වා වු කාලයක සිට පැවතෙන මෙම ලැබිය යුතු මුදල් අයකර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට 2016 මැයි මාසය වන විටත් විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| | ------------------------------- | -------------- |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම.<br><br>ඉඩම් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබීම.<br>නිෂ්ක්‍රීය වත්කම් පැවතීම. |
| (ආ) | කොන්ත්‍රාත් පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම.<br><br>ඉදිකිරීම් වල පවතින අඩුපාඩු කොන්ත්‍රාත්කරු වෙතින් වහාම සකස් කර ගැනීමට කටයුතු නොකිරීම. |